110

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2007

**ESD 1230 -** ළමා සංවර්ධනය

කාලය - පැය තුනයි.

---

දිනය - 2007.12.02 වේලාව - ප.ව.02.00 - ප.ව.05.00 දක්වා

---

පළමුවන කොටසේ ප්‍රශ්න සියල්ලටම (08) සහ දෙවන කොටසින් තෝරාගත් ප්‍රශ්න 3 කට පමණක් පිළිතුරු සපයන්න.

**පළමුවන කොටස**

01. ළමයාගේ වර්ධනය සහ සංවර්ධනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද ?

02. i. ළමා සංවර්ධනයට බලපාන පූර්ව ප්‍රසව පරිසර සාධක දෙකක් දක්වන්න.
    ii. ඉන් ඕනෑම එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

03. i. ළමයාගේ චින්තනයේ අවිදුර සංවර්ධන කලාපය යනු කුමක් ද?
    ii. අවිදුර සංවර්ධන කලාපය ජය ගැනීම සඳහා දායක වන සාධක තුනක් දක්වන්න.

04. i. අවධානය යනු කුමක්දැයි නිර්වචනය කරන්න.
    ii. ළමුන් අවධානය යොමු කිරීමට යොදා ගන්නා විධි දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

05. i. මූලික ස්මෘති ප්‍රභේද මොනවාද ?
    ii. ළමුන්ගේ ස්මෘති ප්‍රවර්ධනය සඳහා ඔබට සහාය විය හැකි විධි දෙකක් සඳහන් කරන්න.

06. i. ළමයින්ගේ භාෂා සංවර්ධනය පිළිබඳ ඔබ දන්නා න්‍යායාත්මක අදහස් තුනක් දක්වන්න.
    ii. ප්‍රාථමික පාසල් දරුවෙකු තුළ ඔබට නිරීක්ෂණය කළහැකි භාෂා නිපුණතා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

07. i. "ස්වයං සංකල්පය" යන්න අර්ථ දක්වන්න.
    ii. ළමයින්ගේ ස්වයං සංකල්පය සඳහා බලපාන සාධක දෙකක් සඳහන් කරන්න.

08. දරුවන් හදාවඩා ගැනීම පිළිබඳ 'පූර්ණ බලාධිපත්‍ය' ශෛලිය යන්න විස්තර කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## දෙවන කොටස

09. i. ප්‍රාථමික පාසල් දරුවාගේ භාෂාව සංවර්ධනය කිරීමේදී ගුරුවරයාගේ භූමිකාව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ii. ප්‍රාථමික මූලික ශ්‍රේණි 1 පන්තිය සඳහා පහත සඳහන් භාෂා හැකියා සංවර්ධනය කිරීමට උචිත ක්‍රියාකාරකම බැගින් විස්තර කරන්න.

(අ) කියවීම
(ආ) ලිවීම

(ලකුණු 06)

iii. ඉහත එක්-එක් ක්‍රියාකාරකමට අදාල අරමුණු 3 බැගින් දක්වන්න.

(ලකුණු 06)

10. i. පියාජේගේ න්‍යායට අනුව බාලවියේ ළමයින්ගේ චින්තන ස්වභාවය ඔබ වටහා ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ඉහත සඳහන් චින්තන ස්වභාවයට අනුව ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු තුනක් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

11. i. ළමයින් මුහුණපාන 'අවධානය' පිළිබඳ දුෂ්කරතා මොනවාද? විස්තර කරන්න.

(ලකුණු 08)

ii. ගුරුවරියක වශයෙන් පංති කාමරය තුළ ළමයින්ගේ අවධානය පවත්වා ගැනීම සහ ලබා ගැනීම සඳහා ඔබ කුමක් කරන්නේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

12. "නම්‍යශීලී වීමෙන් හෝ පූර්ණ බලාධිපත්‍ය වීමෙන් සාර්ථක දරුවකු බිහි නොවේ." දරුවන් හදා වඩා ගැනීමෙහි විවිධ ශෛලීන් පදනම් කර ගනිමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 20)

13. "ළමා සංවර්ධනය පිළිබඳ පර්යාලෝකනයන් කාලයත් සමග වෙනස් වෙමින් ඉදිරියට යයි."

i. ඕනෑම දාර්ශනිකයන් දෙදෙනෙකුගේ ළමා සංවර්ධනය පිළිබඳ අදහස් විවේචනාත්මකව විමර්ශනය කරන්න.

(ලකුණු 10)

ii. ෆ්‍රොයිඩ් විසින් ඉදිරිපත් කරන ලද ළමා සංවර්ධනය පිළිබඳ අදහස් පරීක්ෂා කරන්න.

(ලකුණු 10)

- හිමිකම් ඇවිරිණි. -